## 2. මහාමොග්ගල්ලානත්ථෙරාපදානං

374. **අනොමදස්සී** භගවා ලොකජෙට්ඨො නරාසභො,
විහාසි හිමවන්තම්හි දෙවසඞ්ඝපුරක්ඛතො.

375. **වරුණො** නාම නාමෙන නාගරාජා අහං තදා,
කාමරූපී විකුබ්බාමි[1] මහොදධිනිවාසහං.[2]

376. සඞ්ගණියං[3] ගණං හිත්වා තූරියං පට්ඨපෙසහං,
සම්බුද්ධං පරිවාරෙත්වා වාදෙසුං අච්ඡරා තදා.

377. වජ්ජමානෙසු තූරියෙසු[4] දෙවා තූරියානි[5] වජ්ජයුං,[6]
උභින්නං සද්දං සුත්වාන බුද්ධො'පි[7] සම්පබුජ්ඣථ.

378. නිමන්තයිත්වා සම්බුද්ධං සකං භවනමුපාගමිං,
ආසනං පඤ්ඤපෙත්වාන කාලමාරොචයිං අහං.

379. ඛීණාසවසහස්සෙහි පරිවුතො ලොකනායකො,
ඔභාසෙන්තො දිසා සබ්බා භවනං මෙ උපාගමි.

380. උපවිට්ඨං මහාවීරං දෙවදෙවං නරාසභං,
සභික්ඛුසඞ්ඝං තප්පෙසිං[8] අන්නපානෙන'හං තදා.

381. අනුමොදි මහාවීරො සයම්භූ අග්ගපුග්ගලො,
භික්ඛුසඞ්ඝෙ නිසීදිත්වා ඉමා ගාථා අභාසථ.

---

1. විකුප්පාමි. ථෛ. 2. නිවාසයං. ම ථෛ. 3. අඞ්ගිණියං. සෙ. අඞ්ගිනියං. අ.
4. තූරෙසු. ම. ථෛ. 5. තුරානි. ම ථෛ. 6. වජ්ජිංසු. P T S. සෙ. අ
7. සම්බුද්ධො. ථෛ. 8. තප්පෙමි. ථෛ. ම.
* 372-73 ඉමා දෙව ගාථායො - සෙ. P T S. පොත්ථකෙසු න විජ්ජන්ති.

## 2. මහාමෞද්ගල්‍යායනස්ථවිරාවදානය

374. ලොකජ්‍යෙෂ්ඨ වූ නරශ්‍රෙෂ්ඨ වූ **අනොමදස්සී** භාග්‍යවතුන් වහන්සේ දිව්‍යසමූහයා විසින් පිරිවරණ ලදුව හිමවතෙහි විසූහ.

375. එකල්හි මම නමින් වරුණ නම් වූ නාගරාජයෙක් වීමි. කැමැති රූපයන් මවනසුලු වූයෙමි සෘද්ධිවිකුර්වණය කරමි. මම මහසයුර නිවාස කොට ඇත්තේ වීමි.

376. නිතර සිය පිරිවර වූ නාගසමූහයා හැර මම තූර්‍ය්‍යවාදනයන් පැවැත්වීමි. එකල්හි නාමෙණෙවියෝ (අනොමදස්සී) බුදුරජානන් වහන්සේ පිරිවරා ගෙණ වාදනය කළාහු ය.

377. (මනුෂ්‍ය – නාග) තූර්‍ය්‍යයන් වාදනය කරණු ලබන කල්හි (චාතුර්මහාරාජික) දේවියෝ ද දිව්‍යතූර්‍ය්‍යයන් වාදනය කළාහු ය. මේ දෙපිරිස ගේ තූර්‍ය්‍යශබ්දය අසා බුදුරජානන් වහන්සේ ඒ බව දත් සේක.

378. බුදුරජානන් වහන්සේට ආරාධනා කොට ස්වකීය නාගභවනයට එළඹියෙමි. මම අසුන් පණවා (දානයට සුදුසු) කාලය සැල කෙළෙමි.

379. රහතුන් දහසක් විසින් පිරිවරණලද බුදුරජානන් වහන්සේ සියලු දිසාවන් බබුළුවමින් මාගේ භවනයට එළඹිසේක.

380. එකල්හි මම (එසේ) වැඩහුන් භික්ෂුසංඝයා සහිත වූ මහාවීර වූ දෙවාතිදෙව වූ නරශ්‍රෙෂ්ඨ වූ බුදුරජානන් වහන්සේ ආහාරපානයෙන් සන්තර්පණය කෙළෙමි.

381. සියල්ල තෙමේ ම අවබොධ කළා වූ මහාවීර වූ අග්‍රපුද්ගල වූ බුදුරජානන් වහන්සේ භික්ෂුසංඝයා මැද හිඳ අනුමොදනාව කළසේක. මේ ගාථාවෝ ද වදාරණ ලදහ:–

Free Distribution www.aathaapi.org

http://www.dhammikaweb.com/

382. "යො[1] සො සඞ්ඝං අපූජෙසි[2] බුද්ධඤ්ච ලොකනායකං,
තෙන චිත්තප්පසාදෙන දෙවලොකං ගමිස්සති.

383. සත්තසත්තතික්ඛත්තුං ච දෙවරජ්ජං කරිස්සති,
පඨව්‍යා රජ්ජං[3] අට්ඨසතං වසුධං ආවසිස්සති.

384. පඤ්චපඤ්ඤාසක්ඛත්තුඤ්ච චක්කවත්ති භවිස්සති,
භොගා අසඞ්ඛියා තස්ස උප්පජ්ජිස්සන්ති තාවදෙ.

385. අපරිමෙය්‍යෙ ඉතො කප්පෙ **ඔක්කාක**කුලසම්භවො,
**ගොතමො** නාම නාමෙන[4] සත්ථා ලොකෙ භවිස්සති.

386. නිරයා සො චවිත්වාන මනුස්සත්තං ගමිස්සති,
**කොලිතො** නාම නාමෙන බ්‍රහ්මබන්ධු භවිස්සති.

387. සො පච්ඡා පබ්බජිත්වාන කුසලමූලෙන චොදිතො,
ගොතමස්ස භගවතො දුතියො හෙස්සති සාවකො.

388. ආරද්ධවීරියො පහිතත්තො ඉද්ධියා පාරමිං ගතො,
සබ්බාසවෙ පරිඤ්ඤාය නිබ්බායිස්සතනාසවො."

389. පාපමිත්තොපනිස්සාය කාමරාගවසං ගතො,
මාතරං පිතරඤ්චාපි ඝාතයිං දුට්ඨමානසො.

390. යං යං යොනුපපජ්ජාමි නිරයං අථ මානුසං,
පාපකම්මසමඞ්ගිත්තා[5] භින්නසීසො මරාමහං.[6]

391. ඉදං පච්ඡිමකං මය්හං චරිමො වත්තතෙ භවො,
ඉධාපි එදිසං[7] මය්හං මරණකාලෙ භවිස්සති.

392. පවිවෙකමනුයුත්තො සමාධිභාවනාරතො,
සබ්බාසවෙ පරිඤ්ඤාය විහරාමි අනාසවො.

393. ධරණිම්පි සුගම්භීරං බහලං දුප්පධංසියං,
වාමඞ්ගුට්ඨෙන බොහෙය්‍යං[8] ඉද්ධියා පාරමිං ගතො.

394. අස්මිමානං න පස්සාමි මානො මය්හං න විජ්ජති,
සාමණෙරෙ උපාදාය ගරුචිත්තං කරොමහං.

395. අපරිමෙය්‍යෙ ඉතො කප්පෙ යං කම්මමභිනීහරිං,
තාහං භූමිමනුප්පත්තො පත්තො'මහි ආසවක්ඛයං.

396. කිලෙසා ඣාපිතා මය්හං -පෙ- කතං බුද්ධස්ස සාසනං.

(396, 397, 398 ගාථා 371, 372, 373 ගාථාහි සමා.)

ඉත්ථං සුදං ආයස්මා **මහාමොග්ගල්ලානො** ථෙරො
ඉමා ගාථායො අභාසිත්ථාති.

**මහාමොග්ගල්ලානත්ථෙරස්ස අපදානං දුතියං.**

---

1. යං. ම. ථෙ. 2. අභොජෙසි. ථෙ. 3. පඨව්‍යා රජ්ජං. මු. අ.
4. ගොත්තෙන. සෙ. 5. සමඞ්ගිතො. ථෙ.-සමඞ්ගීතා PTS.
6. භවාම'හං PTS. සෙ 7. තාදිසො. ථෙ. එදිසො. ම. 8. චලෙය්‍යං. ථෙ.



http://www.dhammikaweb.com/

382. "යමෙක් තෙම ලොකනායක වූ බුදුරජාණන් වහන්සේ ද සංඝයා ද පිදී නම්, හෙතෙම ඒ සිත පැහැදවීම් හෙතුවෙන් දෙව්ලොවට යන්නේ ය.

383. තවද සත්සැත්තෑවරක් දිව්‍යරාජ්‍යය කරන්නේ ය. අටසියක් වරෙක පෘථිවිරාජ්‍යය කරමින් පොළොවෙහි වෙසෙන්නේ ය.

384. පස්පණස්වරක් සක්විතිරජ වන්නේ ය. එකල්හි ඔහුට අපමණ භොගයෝ උපදින්නාහු ය.

385. මෙයින් අපරිමෙය්‍ය කල්පයෙහි (=එකාසඞ්ඛ්‍ය කල්පලක්‍ෂයකින් පසු ව) **ඔක්කාක** කුලයෙහි උපන්නා වූ ගොත්‍රයෙන් **ගෞතම** නම් වූ ශාස්තෲන් වහන්සේ ලොකයෙහි පහළ වන්නේ ය.

386. හෙතෙම (=වරුණ නාගරාජ තෙම) නිරයෙන් චුත ව මිනිසත් බවට යන්නේ ය. නමින් **කොලිත** නම් වූ බ්‍රාහමණයෙක් වන්නේ ය.

387. හෙතෙමේ පසු ව කුශලමූලයන් විසින් මෙහෙයන ලදුයේ පැවිදි ව **ගෞතම** බුදුරජානන් වහන්සේගේ ද්විතීය ශ්‍රාවකයා වන්නේ ය.

388. පටන් ගන්නා ලද වීය්‍ය්‍යීඇත්තේ සෘද්ධියෙහි කෙළ පැමිණියේ සියලු ආශ්‍රවධර්මයන් පිරිසිඳ දැන (දුරු කොට) ආශ්‍රවරහිත ව කෙලශ-පරිනිර්වාණයෙන් පිරිනිවන් පාන්නේ ය."

389. පාපමිත්‍රයන් ඇසුරෙන් කාමරාගයෙහි වසඟයට ගියේ දුෂ්ට සිත් ඇත්තේ මව ද පියා ද නැසීමි.

390. මම නිරයෙහි හෝ නැතහොත් මිනිසුන් අතර හෝ යම් යම් යොනියක උපදිම් නම්, (එකී) පාපකර්මයෙන් යුක්ත වීම නිසා බිඳීගිය හිස් ඇත්තෙම් මැරෙමි.

391. මෙය මාගේ සසරෙහි අවසානය යි. අන්තිම ආත්මභාවය වේ. මේ ආත්මයෙහි දී ද මැරෙණ කල්හි මට මෙබන්දක් වන්නේ ය.

392. ප්‍රකර්ෂවිවෙකයෙහි යෙදුනේ සමාධිභාවනාවෙහි ඇලුනේ සියලු ආශ්‍රවයන් පිරිසිඳ දැන (දුරු කොට) ආශ්‍රවරහිත ව වෙසෙමි.

393. සෘද්ධියෙහි කෙළ පැමිණියා වූ මම ඉතා ගැඹුරු වූ ඝන වූ නො සෙල්විය හැකි පොළොව ද වම්පය මහපටැඟිල්ලෙන් සොළවන්නෙමි.

394. අස්මිමානය (=මම ය යන හැඟීම) නො දකිමි. මට මානය නැත. මම සාමණෙරනකු පටන් කොට සියලු භික්‍ෂුසඞ්ඝයා කෙරෙහි ගෞරව සිත (ඇති) කරමි.

395. මෙයින් එකාසඞ්ඛ්‍ය කල්ප ලක්‍ෂයකට (=අපරිමෙය්‍ය කල්පයකට) පෙර (අගසව් බව පිණිස) යම් කර්මයක් රැස් කෙළෙම් ද, මම ඒ ශ්‍රාවක භූමියට පත් වීමි. ආශ්‍රවක්‍ෂයසඞ්ඛ්‍යාත නිවණට පැමිණියෙමි.

396. මා විසින් කෙලශයෝ දවන ලද්දාහු ය. -පෙ- බුදුරජානන් වහන්සේගේ අනුශාසනය ද කරණ ලදි.

(396 397-398- යන ගාථාවෝ 371-372-373 යන ගාථාවන් හා සමාන වෙති.

මේ අයුරින් ආයුෂමත් මහාමෞද්ගල්‍යායන ස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් දෙශනා කළ සේකි.

**දෙවෙනි වූ මහාමෞද්ගල්‍යායනස්ථවිරාපදානය යි.**